**ශීර්ෂය 419 - කලාපීය සහයෝගිතා කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය**

**------------------------------------------------------------------**

1. **මූල්‍ය ප්‍රකාශන**

**-----------------**

1.1 **තත්ත්වාගණනය කළ මතය**

**----------------------------**

කලාපීය සහයෝගිතා කටයුතු රාජ්‍ය අමාත්‍යාංශයේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව කලාපීය සහයෝගිතා කටයුතු රාජ්‍ය අමාත්‍යාංශයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2021 ජූනි 21 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2021 ජූලි 05 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2020 දෙසැම්බර් 31 දිනට කලාපීය සහයෝගිතා කටයුතු රාජ්‍ය අමාත්‍යාංශයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 **තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

**--------------------------------------------**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 **මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

**----------------------------------------------------------------------------------------------------**

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව රාජ්‍ය අමාත්‍යාංශය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව රාජ්‍ය අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවාද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- මූල්‍ය ප්රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

**1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

-----------------------------------------------

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

කලාපීය සහයෝගිතා කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය සමාලෝචිත වර්ෂයේදී ස්ථාපිත වී ඇති බැවින් ඉකුත් වර්ෂයට අදාළව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ අවශ්‍යතාවයක් නොතිබුණි.

**1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**-----------------------------------------------**

**1.6.1 අක්මුදල් ගැලපුම් ගිණුම**

**---------------------------**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය සඳහා පිළියෙල කර තිබූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය අනුව 2020 දෙසැම්බර් 31 දිනට රු. 48,064,517 ක සෘණ අග්‍රිම ශේෂයක් පැවතියද, එය ගැලපුම් කිරීම සඳහා අක්මුදල් ගැලපුම් ගිණුමක් පිළියෙල කර නොතිබුණි. | මෙම රාජ්‍ය අමාත්‍යාංශය ශීර්ෂය යටතේ 2020 වර්ෂය සඳහා වෙනම අක්මුදල් භාණ්ඩාගාරය විසින් ලබා දී නොමැති බැවින් අක්මුදල් ගිණුමක් සකස් කර නොමැත. | රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව විසින් නිකුත් කළ මාර්ගෝපදේශ අංක 06 අනුව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතු වීම. |

**1.6.2 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය**

**-----------------------------------**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේදී රු. 1,810,407 ක මූලධන වත්කම් අත්පත් කර ගෙන තිබුණද එය මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ දේපළ පිරියත හා උපකරණ යටතේ සහ දේපළ පිරියත හා උපකරණ සංචිතයෙහි දක්වා නොතිබුණි. | දෙසැම්බර් 31 දිනට වටිනාකම් වලට අදාළව සටහන් ඇතුළත් කිරීමට කටයුතු කරමි. | රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව විසින් නිකුත් කළ මාර්ගෝපදේශ අංක 06 අනුව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතු වීම. |

## 1.6.3 මූල්‍ය කාර්යයසාධන ප්‍රකාශනය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| භාණ්ඩාගාර පරිගණක මුද්‍රිතය අනුව රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ලැබීම් හා ගෙවීම් පිළිවෙලින් රු. 382,221 ක් හා රු. 2,608,620 ක් වුවත්, මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශයේ අත්තිකාරම් ලැබීම් හා ගෙවීම් පිළිවෙලින් රු. 380,683 ක් හා රු. 763,957 ක් ලෙස දක්වා තිබුණි. ඒ අනුව රු. 1,538 ක හා රු. 1,844,663 ක වෙනසක් නිරීක්ෂණය විය. | එම වෙනසට හේතුව වන්නේ අදාළ වැරදි නිවැරදි කිරීම් සිදුකරන ලද හර හා බැර සටහන්වල වටිනාකමයි. | රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව විසින් නිකුත් කළ මාර්ගෝපදේශ අංක 06 අනුව මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය භාණ්ඩාගාර පරිගණක මුද්‍රිතය අනුව පිළියෙල කළ යුතු වීම. |

## 1.6.4 මුදල් ප්‍රවාහ ප්‍රකාශනය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| රාජ්‍ය ගිණුම් දෙපාර්තුමේන්තුවේ මාර්ගෝපදේශ අංක 06 අනුව 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශයක් (ඒසීඒ - (සි) ආකෘතිය) පිළියෙල කර නොතිබුණි. | රාජ්‍ය අමාත්‍යාංශ ශීර්ෂය යටතේ මුදල් ප්‍රවාහ ප්‍රකාශනයක් පිළියෙල කිරීම සඳහා රාජ්‍ය අමාත්‍යාශයට අදාළව අක් මුදල් ලැබීම් ගෙවීම් 2020 වර්ෂය තුළදී සිදු වී නොමැත. | රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව විසින් නිකුත් කළ මාර්ගෝපදේශ අංක 06 අනුව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතු වීම. |

## 1.6.5 ඒකාබද්ධ ශේෂ පිරික්සුම

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂය සඳහා රාජ්‍ය අමාත්‍යාංශය ඒකාබද්ධ ශේෂ පිරික්සුමක් පිළියෙළ කර නොතිබුණි. | පිළිතුරු ඉදිරිපත් කර නොතිබුණි. | රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව විසින් නිකුත් කළ මාර්ගෝපදේශ අංක 06 අනුව කටයුතු කළ යුතු වීම. |

### 1.6.6 අග්‍රිම ශේෂය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණකාධිකාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| (අ) | අමාත්‍යාංශය වෙනුවෙන් 2020 සැප්තැම්බර් 22 දින බැංකු ගිණුමක් විවෘත කර තිබුණද අග්‍රිම ගිණුම විවෘත කර තිබුණේ 2020 දෙසැම්බර් 10 වන දිනය. අග්‍රිම ගිණුම විවෘත කිරීම ප්‍රමාද වීම හේතුවෙන් 2020 සැප්තැම්බර් 01 දින සිට 2020 දෙසැම්බර් 31 දින දක්වා කාලයට අදාළව රාජ්‍ය අමාත්‍යාංශය විසින් වෙනම ගිණුම් තැබීමේ කටයුතු සිදු කර නොතිබුණි. | අමාත්‍යාංශය වෙනුවෙන් බැංකු ගිණුම 2020 සැප්තැම්බර් 22 දින විවෘත කළද බැංකුව විසින් ඒ බව දැනුම් දෙනු ලැබුවේ 2020 දෙසැම්බර් 03 දිනැති ලිපිය මගිනි. එම ලිපියද රටේ පැවති තත්ත්වය මත අප වෙත ලැබී තිබුණේ 2021 ජනවාරි 15 දිනය.<br><br>කෙසේ වෙතත් දුරකථනය මගින් බැංකුව හා සම්බන්ධ වී අදාළ තොරතුරු භාණ්ඩාගාරය වෙත ඉදිරිපත් කර අග්‍රිම ගිණුම 2020 දෙසැම්බර් 10 දින ආරම්භ කර ගැනීමට හැකි විය. එහෙත් චෙක්පොත් මුද්‍රණය කරවා ගෙන ඉදිරි ගිණුම් කටයුතු ආරම්භ කිරීමට 2020 වර්ෂය තුළ ප්‍රමාණවත් කාලයක් නොතිබිණි. | 2020 නොවැම්බර් 20 දිනැති අංක 06/2020 දරන අයවැය චක්‍රලේඛය අනුව 2020 සැප්තැම්බර් 01 දින සිට 2020 දෙසැම්බර් 31 දින දක්වා කාලයට අදාළව රාජ්‍ය අමාත්‍යාංශය විසින් වෙනම ගිණුම් තැබීමේ කටයුතු සිදු කළ යුතු වීම. |
| (ආ) | විදේශ අමාත්‍යාංශය සඳහා පිළියෙළ කර තිබූ ඒකාබද්ධ ශේෂ පිරික්සුම තුළ රාජ්‍ය අමාත්‍යාංශයට අයත් එකතුව රු. 50,329,524 ක් වූ හර සටහන් පැවතියද එහි බැර සටහන්වල එකතුව රු. 423,421 ක් විය. ඒ අනුව සෘණ අග්‍රිම ශේෂය රු. 49,906,103 ක් වුවද ඉදිරිපත් කරන ලද ගිණුම් අනුව සෘණ අග්‍රිම ශේෂය රු. 48,064,517 ක් ලෙස සටහන් කර තිබුණි. | මෙම අග්‍රිම වෙනසට රජයේ නිලධාරීන්ගේ ගිණුමට අදාළව ආරම්භක හර ශේෂය පවරා ගැනීම හේතු වේ. | රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව විසින් නිකුත් කළ මාර්ගෝපදේශ අංක 06 අනුව කටයුතු කළ යුතු වීම. |

**1.6.7 විගණන සාක්ෂි නොවීම**

**--------------------------**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය<br>------------------------- | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම<br>-------------------------------- | නිර්දේශය<br>-------------------- |
|---|---|---|---|
| (අ) | 2020 නොවැම්බර් 30 දිනැති අංක 06/2020 දරන අයවැය චක්‍රලේඛය අනුව පෙර පැවති වැය විෂයය විස්තර යටතේ වාර්තා කර ඇති වියදම් ජ'නල් සටහන් මඟින් අදාළ අමාත්‍යාංශයට මාරු කළ යුතු වුවද රු. 33,219,960 ක් වූ වියදම් මාරු කිරීමට අදාළ ජ'නල් සටහන් විගණනයට ඉදිරිපත් නොකෙරුණි. | 2020 වර්ෂයෙහි මාරුකිරීම් කරන ලද වැය විෂයය විස්තරයට අදාළ ජ'නල් සටහන් මේ සමඟ ඉදිරිපත් කරමි. | නියමිත වට්නාකමට අදාල ජ'නල් සටහන් ඉදිරිපත් කළයුතු වීම. |
| (ආ) | සමාලෝචිත වර්ෂය තුළදී අත්පත් කර ගන්නා ලද රු. 1,810,407 ක් වූ මූල්‍ය නොවන වත්කම් සඳහා වන ජ'නල් සටහන් සහ විදේශ අමාත්‍යාංශයෙන් මාරු කරන ලද මූල්‍ය නොවන වත්කම් හා තැන්පතු ශේෂයන් මාරු කිරීමට අදාළ ජ'නල් සටහන් විගණනයට ඉදිරිපත් නොකෙරුණි. | අනෙකුත් වට්නාකම් මාරු කිරීම 2020 වර්ෂයට අදාළ භාණ්ඩාගාර පරිගණක මුද්‍රිත පරීක්ෂා කිරීමෙන් පසුව ගිණුම්ගත කිරීමට කටයුතු කර ඇත. | මූල්‍ය නොවන වත්කම් සහ තැන්පතු ශේෂ මාරු කිරීමට අදාළ ජ'නල් සටහන් ඉදිරිපත් කළ යුතු වීම. |

## 2. මූල්‍ය සමාලෝචනය

---

### 2.1 වියදම් කළමනාකරණය

---

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මුදල් රෙගුලාසි 50 (II) ප්‍රකාරව ඇස්තමේන්තු හැකිතාක් දුරට සම්පූර්ණවත්ව නිවැරදිවත්ව පිළියෙල කිරීම ගණන්දීමේ නිලධාරියාගේ වගකීම විය. එහෙත් එසේ කටයුතු නොකිරීම හේතුවෙන් මුදල් රෙගුලාසි 66/69 යටතේ මාරු කිරීම් මගින් ප්‍රතිපාදන වැඩිකර ගත් වැය විෂයයන් 03 ක් ද ඇතුළුව වැය විෂයයන් 25 ක ප්‍රතිපාදිත මුදලින් සියයට 55 ක සිට සියයට 100 ක් දක්වා පරාසයකින් මුලු වටිනාකම රු. 32,670,128 ක් වූ ප්‍රතිපාදන ඌන උපයෝජනය වී තිබුණි. | 2020 මුදල් වර්ෂයට අදාළව 2019 වර්ෂයට අයවැය සකස්කරනු ලබන අවස්ථාවේ සැලසුම් කළ පරිදි ව්‍යාපෘති අවසන් කිරීමට රටතුළ පැවති අයහපත් වාතාවරණය හේතුවෙන් හා වියදම් පාලනය කිරීම සඳහා රජය වරින් වර නිකුත් කරන ලද උපදෙස් අනුව ද කටයුතු කිරීමට සිදු වූ බැවින් මෙම ඉතිරිවීම් සිදු වී ඇත. | ඇස්තමේන්තු හැකිතාක් දුරට සම්පූර්ණවත්ව නිවැරදිවත්ව පිළියෙල කළ යුතු වීම. |

## 2.2 ගණන්දීමේ නිලධාරී විසින් සිදු කළ යුතු සහතිකවීම්

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව ගණන්දීමේ නිලධාරී විසින් පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් සහතික වීම් කළ යුතුව තිබුණත්, ඒ අනුව කටයුතු කර නොතිබුණි.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| රාජ්‍ය අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායීතාවය පිළිබඳව කලින් කළ සමාලෝචනය සිදු කර ඒ අනුව පද්ධති ඵලදායී ලෙස කර ගෙන යෑමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතු බවත්, එම සමාලෝචනයන් ලිඛිතව සිදු කර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණත්, එවැනි සමාලෝචනයන් සිදු කළ බවට ප්‍රකාශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | අදහස් ඉදිරිපත් කර නොතිබුණි. | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |